**හැටන් දික්ඔය නගර සභාව - 2022**

**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

හැටන් දික්ඔය නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හැටන් දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට සභාව සම්බන්ධ නඩු 08 ක් පැවතියද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කරන විට මේ සම්බන්ධ විස්තර උපලේඛනය මඟින් දක්වන බව | නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ 2023 වර්ෂයේ ගෙවන ලද රු.1,322,557 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර නිරවුල් කර තිබූ කර්මාන්ත ණය හිමියන් රු.353,462 ක ශේෂ තවදුරටත් ණය හිමියන් ලෙස දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.2,097,066 ක ස්ථාවර තැන්පත් පොලී ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2008 වසරට පෙර සිට පැවත එන රු.122,643ක පෙර ගෙවුම් ශේෂ 04 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඈ) | රු.446,012 ක වාහන 05 ක්ද, පුස්තකාලවල පැවති මිළ සඳහන් නොවු පොත් 3962 ක්ද, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම වත්කම් ශේෂ 02 කට අදාළ උපලේඛනවල ශේෂයන්ගේ එකතුව සමඟ සැසඳීමේදී රු.11,001,111 ක නොසැසඳීම් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.45,919,014 ක් වටිනා ගිණුම් ශේෂ 02 ක් වත්කම් ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | මෙහි සඳහන් වත්කම් 05 කට අදාළව රු.38,875,754 ශේෂය තහවුරු කරගැනීම සඳහා සාක්ෂි ඉන්වෙන්ට්‍රි පොතේ සටහන් පමණක් ඇති බව | ලේඛන පිළියෙල කර යාවත්කාලීන කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත (255 වන අධිකාරියෙහි) 157 (7) (ඉ) ප්‍රකාරව | දැන්වීම් පුවරු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------- | | | |
| i. | මු.රෙ 371 (5) | 1987 සිට 2021 දක්වා කාල පරාසයක සිට පවත්නා, රු.607,541 ක අත්තිකාරම් 47 ක් පියවීමට කටයුතුකර නොතිබුණි. | අත්තිකාරම් සොයා බලා පියවීමට කටයුතු කරන බව | අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| ii. | මු.රෙ.571 (3) | 2015 පෙබරවාරි 01 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මැදරට පළාත් පාලන සම්මාන උළෙලේ ත්‍යාග ලෙස සභාවට ලැබී තිබුණු රු. 176,697 ක මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී සුදුසු කටයුත්තක් සඳහා යොදවන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක මප/පා.පා.කො/2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | කඩ කාමර 434 ක කඩකුලිය 2006 වර්ෂයෙන් පසුව තක්සේරු කර නොතිබුණි. | තක්සේරුවක් ලබාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර, ඉදිරියේදී තක්සේරු වාර්තාව ලැබීමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,565,879 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,292,731 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් පවත්වාගෙන යන ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය තුළ රු.51,765,961 ක් හා රු.43,512,790 ක් අතර ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණද, අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධන කටයුතුවලට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ත මුදල හැටන් ලංකා බැංකුවේ ස්විප්ට් ගිණුම් ක්‍රමය යටතේ තැන්පත් කර ඇති බව | අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදාගත යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 17,600,000 | 19,310,897 | 16,615,917 | 18,558,706 | 19,100,000 | 19,151,893 | 17,812,098 | 15,863,725 |
| (ii) | කඩ කුලී | 29,195,000 | 14,247,236 | 16,357,087 | 9,576,962 | 29,245,000 | 14,393,678 | 16,014,677 | 11,686,813 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,600,000 | 819,207 | 819,207 | - | 3,700,000 | 2,192,455 | 2,808,205 | - |
| (iv) | වෙනත් ආදායම් | 127,184,000 | 10,648,290 | 8,378,563 | 12,864,349 | 125,683,000 | - | 83,990,703 | 10,594,622 |
| | | 177,579,000 | 45,025,630 | 42,170,774 | 41,000,017 | 177,728,000 | 35,738,026 | 120,625,683 | 38,145,160 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| i. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.3,048,790 ක ඉඩම් බදු හිඟයක් පැවති අතර ඉන් වසර 01 ත් 05 ත් අතර රු.1,429,396 ක්ද, වසර 05 ට වැඩි ශේෂ රු.1,280,325 ක් ද අයකර කරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් ගෙවා නිම කරන ලෙස බදුකරුවන් දැනුවත් කර ඇති බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| ii. | රජයේ දේපලවලින් අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල රු.3,332,979 ක් වන අතර ඉන් වැවිලි ආයතනයකින් රු.2,357,414 ක් හෙවත් මුළු හිඟයෙන් සියයට 71 ක් අයවිය යුතුව පැවතුණි. | ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ආ) | කුලී | | |
| i. | අඩු කුලී නිවාසවලින් වසර 12 ක් පමණ කාලයක සිට රු.218,019 ක කුලී අයකරගෙන නොතිබුණි. | රු.140,712 ක මුදලක් අයකර ගැනීම සඳහා ලිපි යොමු කර ඇති බව | - එම - |
| ii. | 2018 හා 2019 වර්ෂයට අදාළ රු.1,581,710 ක තානායම් කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඇ) | වෙනත් ආදායම් | | |
| i. | රථවාහන වලින් ගාස්තු අයකිරීමේ ගිවිසුම පරිදි ටෙන්ඩර්කරුගෙන් සතියකට රු. 68,280 ක් අයකර ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය වන විටරු. 1,677,475 ක හිඟයක් පැවතුණි. | හිඟය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව | හිඟ මුදල් අයකර ගත යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු සමීක්ෂණය නොකර දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉල්ලීම් කළ ආයතනයන්ගෙන් පමණක් බිල්පත් යොමු කර රු.235,800 ක මුදලක් අයකර තිබුණද 2022 ඔක්තෝබර් 18 දින විගණන පරීක්ෂාවට ලක් වූ පුවරු 36 ක දැන්වීම් සඳහා ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.901,200 ක අලාභයක් සිදුවී තිබුණි. | එළැඹෙන වර්ෂයේදී දැන්වීම් පුවරු සම්බන්ධ සමීක්ෂණ කටයුතු නිසි ලෙස සිදු කර, ආදායම් අයකරගැනීමට කටයුතු කරන බව | සමීක්ෂණයක් කර ආදායම් අයකර ගත යුතුය. |

(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 979,489 ක් හා මුද්දර ගාස්තු රු.11,884,860 ක් විය. | මෙම වැරදි සමුච්චිත අරමුදලින් 2023 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සතිපොල කිසිදු නඩත්තුවකින් හා පිරිසිදු කිරීමකින් තොරව අරමුණු ගත කාර්යයෙන් පරිබාහිරව ස්ථාන 37 ක් බදු දී සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට එම බදුකරුවන්ගෙන් රු.135,817 ක බදුකුලී අයකරගෙනද නොතිබුණි. | සති පොළ භූමිය බාහිර පාර්ශවය වෙනුවෙන් විවෘතව පවතින අතර, ඒ සඳහා මහජනයා දැනුවත් කර ඇත. ඉදිරියේදී අදාළ හිඟ බදු මුදල් අයකිරීමට පියවර ගන්නා බව | නිසි ලෙස නඩත්තු කර හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | මධ්‍යම වෙළඳපොලේ කඩ කාමර 32 ක් වසා දමා තිබුණු අතර බදුකරුවන් විසින් කඩ කාමර හා ගොඩනැගිල්ලට හානි සිදු කිරීම් නිරීක්ෂණය විය. වාතාශ්‍රය සහ ආලෝකය වෙළඳසැල කරා ලැබීමට ඉංජිනේරු සැලැස්ම අනුව ඉදිකර තිබුණු කවුළුව (මැද මිදුල) වසා දමා තිබුණි. ඒ හේතුවෙන් අදාළ වෙළඳ සංකීර්ණයේ පහළ මහල සම්පූර්ණයෙන්ම අඳුරු වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙළඳපල අළුත්වැඩියා කර නිසි කළමනාකරණයකින් පවත්වා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 නොවැම්බර් 01 දිනෙන් පසු සභාව විසින් අය කරන ලද එකතු කළ අගය මත බදු රු.1,099,722 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තොරතුරු සොයා බලා අදාළ මුදල් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව | තැන්පත් ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 09 සිට වසර 13 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.9,985,139 ක ගිණුම් ශේෂ 03 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වසර 03 සිට වසර 11 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.4,416,477 ක ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | දිගු කාලයක සිට පවතින ශේෂ සොයා බලා නිරවුල් කරන බව | ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් රජයේ නිවාස දෙකකින් ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා පදිංචි කාලය වෙනුවෙන් එකතුව රු.121,057 ක ගෙවල් කුලිය අයකර ගෙන නොතිබුණි. | නිවස කුලිය ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට ලිඛිතව දැනුවත් කර ඇති බව | හිඟ කුලිය අය කළ යුතුය |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 05 ක් අභාවිතව පැවතුණු අතර ඉන් වාහන 04 ක් අළුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පැවතුණි. එම වාහන සඳහා ලබාගත් රු.414,548 ක ටයර් ටියුබ් හා අමතර කොටස් ගබඩාවේ ඌණ උපයෝජිතව පැවතුණි. | එම වාහන අමතර කොටස් සභාවේ වෙනත් වාහන සඳහා යෙදවීමට කටයුතු කරනු ලබන බව | අමතර කොටස් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හැටන් නගර මධ්‍යයේ පිහිටි විශාල ශාලාවක්, මුළුතැන්ගෙයක් හා වැසිකිළි පද්ධතියක් සහිත උත්සව ශාලාව හා හැටන් දික්ඔය කියවීම් ශාලාව හා පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියාවකින් හා නඩත්තුවකින් තොරව පුස්තකාල පොත් 3000 ක් සමඟ විනාශවීමට ඉඩහැර තිබුණි. | ඉදිරියේදී මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව | අළුත්වැඩියාකර නඩත්තු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.2,292,061 ක වියදමින් පිහිලි හතර ඇල්ල අදියර I හා II රැඳවුම් බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේදී ඇලෙහි රොන්මඩ යන්ත්‍ර මඟින් ඉවත් කර තිබුණද, අතින් (Manual) ඉවත් කළ බවට රු.80,685 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර රු.13,230 ක පාඩුවක් සිදුකර තිබුණි. | ව්‍යාපෘතියට අදාලව Hummer Test වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව | ඇස්තමේන්තු පිරිවිතර අනුව කටයුතු කළ යුතුය. |

**3. 6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට තනතුරු 22ක පුරප්පාඩු 76ක් පැවතුණි. සෞඛ්‍ය කම්කරු තනතුරේ පවතින සියයට 42 ක පුරප්පාඩු කසල කළමනාකරණයේ විධිමත් කර ගැනීම කෙරෙහි මූලිකව බලපා තිබූ අතර ආදායම් පරීක්ෂකු නිළධාරීන් දෙදෙනකු සභාවේ ලේකම් හා පරිපාලන නිළධාරීන් තවදුරටත් පුරප්පාඩු වී පැවතීම ආදායම් රැස් කිරීම හා අභ්‍යන්තර පාලනය විධිමත්ව පවත්වාගෙන යාමට ගැටළුවක්ව පැවතුණි. | පවතින ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරන බව | කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන බව | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීපාවලී උත්සව සමය උදෙසා හැටන් තරු චතුරශ්‍රය ආශ්‍රිතව හා ශක්ති ශාලාව අසල තාවකාලික කඩ කාමර 140 ක් පිහිටි ප්‍රදේශය ඉතාමත් අපිරිසිදුව තත්ත්වයේ පැවති අතර, අපවිත්‍ර කැලිකසළ පිරුණු ජලය නිසි ලෙස ගලා නොයන ලෙස හා ස්ථිර වෙළඳසැල් අවහිර වන ලෙස භූමිය ලකුණු කර තිබුණි. | ඉදිරියේදී එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | පරිසරය පිරිසිදුව තබාගත යුතු අතර සුදුසු පරිදි කඩ කාමර ස්ථානගත කළ යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා 2017 අංක 19 තිරසර සංවර්ධන පනත ප්‍රකාරව ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණි. | ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලබන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |